**අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය -2020**

**13 ශ්‍රේණිය - දේශපාලන විද්‍යාව - 1 පත්‍රය - කාලය පැය 2**

**ආදර්ශ ප්‍රශ්න පත්‍රය**

- මෙම ප්‍රශ්න පත්‍රය A හා B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වේ.
- A කොටස බහුවරණ ප්‍රශ්න 30කින් හා B කොටස කෙටි ප්‍රශ්න 20කින් යුක්ත වේ.
- එක් පිළිතුරකට ලකුණු 2 බැගින් ලකුණු 100කි.

අංක 1 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

1.දේශපාලන විද්‍යාව,
A- දේශපාලන දාර්ශනිකයින්ගේ සහ දේශපාලන චින්තකයින්ගේ අදහස් මගින් පදනම සැපයීම.
B- ශුද්ධ විද්‍යාත්මක ක්‍රම මගින් පමණක් අධ්‍යයනය කළ හැකි විෂයක් වීම.
C- මිනිසුන්ගේ දේශපාලන චර්යාව හා දේශපාලන ක්‍රියාවන් අධ්‍යයනය කිරීම.
D- රාජ්‍යය,ආණ්ඩුව හා මිනිසා අතර සම්බන්ධතාවය න්‍යායාත්මකව හැදෑරීම.
E- කාලීන විකාශනය සමඟ විෂය පථය පුළුල් වී ඇත.

1. ABCD 2. ABCE 3. BCDE 4.ACDE 5.ABDE

2. දේශපාලනය ,
A-දේශපාලන බල අරගලය ජාතික හා අන්තර්ජාතික වශයෙන් ක්‍රියාත්මක වේ.
B- සම්පූර්ණයෙන්ම ප්‍රායෝගික ක්‍රියාවලියකි.
C- රාජ්‍ය බලය ඉක්මවා යන සමාජ භාවිතාවක් වේ.
D- දේශපාලන පක්ෂ සහ දේශපාලනඥයන් ප්‍රධාන රැඟුම්කරුවන් වේ.
E- දේශපාලන දාර්ශනිකයින් සහ චින්තකයන්ගේ භූමිකාව වැදගත් වේ.

1. ABCD 2. ABCE 3. BCDE 4.ACDE 5.ABDE

3. නූතන සමාජයන්හි රාජ්‍යය,
A- ජාතික රාජ්‍යය යනුවෙන්ද හැඳින්වේ.
B- බාහිර හා අභ්‍යන්තර ස්වාධිපත්‍ය බලය හිමි කර ගෙන සිටියි.
C- බලහත්කාරී බලය පිළිබඳ ඒකාධිකාරයට හිමිකම් කියයි.
D- ආණ්ඩුවට සමාන වේ.
E- තම සාමාජිකයින් විය යුත්තේ කවුරුන්දැයි තීරණය කරයි.

1. ABCD 2. ABCE 3. ABDE 4.ACDE 5. BCDE

4. ආණ්ඩුව ,

A- ලෝකයේ රාජ්‍යවල ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම විවිධ ආකෘතිවලින් යුක්ත වේ.
B- ස්වාධිපත්‍ය බලය ක්‍රියාත්මක කරන සමස්ත සංවිධාන රටාවම වේ.
C- එක් අයකුගෙන් ,කිහිපදෙනෙකුගෙන් හෝ බොහෝ දෙනෙකුගෙන් සමන්විත වේ.
D- ස්වාධිපති බලයේ එකම උරුමකරුවා වේ.
E- අස්ථිර ආයතනයකි.

1. ABCD 2. ABCE 3. ABDE 4.ACDE 5. BCDE

5. ස්වාධිපත්‍ය බලය ,

A-නීතියේ උල්පතයි.
B- හිමිවන්නේ පාලකයාට පමණි.
C- අවශ්‍ය ඕනෑම විටක බෙදිය හැකියි.
D-අන්සතු කළ නොහැකියි.

E- රාජ්‍යයේ උත්තරීතර බලය සංකේතවත් කරයි.

1. ABCD 2. ABCE 3. ABDE 4.ACDE 5. BCDE

6. ඒකීය ආණ්ඩුක්‍රම ආකෘතිය,
A-භූමි ප්‍රමාණයෙන් කුඩා රාජ්‍යයන්ට හිතකර වීම.
B- ඒකීය පරිපාලන රටාව හා අධිකරණ රටාව C-මධ්‍යම ආණ්ඩුවේ උත්තරීතරභාවය
D- බලය සංකේන්ද්‍රණය වී තිබීම.

E- විවිධත්වය තුළින් ඒකීයත්වය ආරක්ෂා කිරීම.

1. ABCD 2. ABCE 3. ABDE 4.ACDE 5. BCDE

7. සන්ධීය ආණ්ඩුක්‍රමයක ලක්ෂණ වන්නේ,

A- ස්වාධිපත්‍ය ක්‍රියාත්මක කළ හැකි බල මධ්‍යස්ථාන ගණනාවක් පැවතීම.
B- ලිඛිත අනම්‍ය ව්‍යවස්ථාව
C- පාර්ලිමේන්තු කැබිනට් ක්‍රමයක් පැවතීම.
D- ද්විත්ව පරිපාලනයක් පැවතීම.
E- ප්‍රාදේශීය ආණ්ඩුවලට සමානව සැලකීම.

1. ABCD 2. . BCDE 3. ABDE 4.ACDE 5 ABCE

8.සහසන්ධීය ක්‍රමයක ආකෘතියට අනුව,

A-මෙවැනි ක්‍රමයක් බිහිවන්නේ ස්වාධීනත්වය ඇති දේශපාලන ඒකක ගණනාවක් එකතු වීමෙනි.

B-පරමාධිපත්‍යයෙන් යුත් රාජ්‍ය ගණනාවක සංගමයක් ලෙස සකස් වී ඇත.

C- මෙවැනි ක්‍රමයක මධ්‍යම ආණ්ඩුවට බලතල ලැබෙන්නේ සාමාජික රාජ්‍ය මගිනි.

D- සහ සන්ධීය ක්‍රමයක මධ්‍යම ව්‍යවස්ථාදායකයක් ක්‍රියාත්මක නොවේ.

E- මධ්‍යම ආණ්ඩුවට සාමාජික රාජ්‍යවල පුරවැසියන් වෙත තම බලය ක්‍රියාත්මක කළ නොහැකිය.

1. ABCD 2. ABCE 3. BCDE 4.ACDE 5.ABDE

9.කැබිනට් ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ වන්නේ,

A-රාජ්‍ය නායකයා විසින් ආණ්ඩුවේ නායකයා තීරණය කිරීම.

B-සත්‍ය විධායකය ව්‍යවස්ථාදායකයේ සාමාජිකයින්ගෙන් පමණක් සමන්විත වීම.

C- නාමික විධායකය ව්‍යවස්ථාදායකය වෙත වගවීම.

D- වගකීම් සහගතභාවය හා ප්‍රජාතන්ත්‍රවාදීභාවය

E- ව්‍යවස්ථාදායකය හා විධායකය අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකා මත රඳා පැවතීම.

1. ABCD 2. ABCE 3. BCDE 4.ACDE 5.ABDE

10. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක කාර්යයන් වන්නේ,

A-රාජ්‍යයේ ස්වභාවය පෙන්නුම් කිරීමයි.

B- රාජ්‍යයේ දේශපාලන මතවාද පෙන්නුම් කිරීමයි.

C- ජාතිය ගොඩනැගීම.

D- ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිතකොට පවත්වා ගැනීම.

E- රාජ්‍යයේ විදේශ ප්‍රතිපත්තිය නියම කිරීම.

1. ABCD 2. . BCDE 3. ABDE 4.ACDE 5 ABCE

අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.

11.නූතන ජාතික රාජ්‍යය,

1-සකස් වී ඇත්තේ භූමිය,ජනගහනය,ආණ්ඩුව හා ස්වාධිපත්‍ය මතයි.

2- රාජ්‍යයක පැවැත්ම රඳා පවතින්නේ අනෙකුත් රාජ්‍යයන්ගෙන් ලැබෙන පිළිගැනීම මතයි.

3- භූමි ප්‍රමාණය හෝ ජනගහනය හෝ ආණ්ඩුක්‍රමයේ ස්වභාවය අනුව වෙනස් වුවද සෑම රාජ්‍යයක්ම එක සමානය.
4- පදනම් වී ඇත්තේ එක් ජාතියක්,එක් රාජ්‍යයක් යන සංකල්පය මතයි.
5-බලය මධ්‍යගත වී ඇත.

12.රාජ්‍ය පිළිබඳ සමාජ සම්මුතිවාදය,
1.රාජ්‍යය දෙවියන්ගේ නිර්මාණයක් බව පිළිගනී.
2.තෝමස් හොබ්ස්,ජෝන් ලොක්,ෂෝන් ෂාක් රූසෝ ප්‍රධාන චින්තකයන්ය.
3.සමාන ආකෘතියක් භාවිතා කරමින් වෙනස් අදහස් තුනක් නියෝජනය කරන ලදී.
4.නූතන ප්‍රජාතන්ත්‍රවාදී න්‍යායේ වර්ධනයට හේතු විය.
5.රාජ්‍යය සෑම කල්හිම මානව සමාජය තුළ පැවත ඇති බව තහවුරු කරන ලදී.

13.ලිබරල්වාදය,
1.මිනිස් සංහතියේ පැවැත්ම ඇති තුරා රාජ්‍යය පවතින බව දක්වයි.
2.රාජ්‍යය මිනිසාගේ සභයට අවශ්‍ය වේ.
3.පෞද්ගලික දේපළ ක්‍රමය අගය කරයි.
4.පෞද්ගලික නිදහස ප්‍රධාන තේමාවයි.
5.අනාගතයේ රාජ්‍ය වියැකී වන බව දක්වයි.

14.සමාජවාදයට අනුව,
1.රාජ්‍ය බිහිවන්නේ පන්ති පරතරය මුල් කර ගෙනය.
2.රාජ්‍යය දේපළ හිමියන්ගේ අභිලාෂය නියෝජනය කරයි.
3.රාජ්‍යය පෙනී සිටින්නේ සමාජයේ අභිවෘද්ධිය සඳහාය.
4.රාජ්‍යය පන්ති පරතරය ඇති තාක් පවතී.
5.සමාජවාදී යුගයේ රාජ්‍යය පාලනය කරන්නේ නිර්ධන පන්තියයි.

15.ෆැසිස්ට් ආණ්ඩු ක්‍රමයක,
1.නිදහස හා අයිතිවාසිකම් මර්දනය කිරීම.
2.බුද්ධි විරෝධී බව හා යුදකාමී බව.
3.නිදහස් ජනමාධ්‍ය තහවුරු කිරීම.
4.බලතල වෙන් කිරීම නොසලකා හැරීම.
5.අසමානතාව පිළිගැනීම.

ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

16. ගැටුම් පරිවර්තනය මගින් සිදුවන්නේ,

1.ගැටුම් සමථනයට අවකාශ ලබා දීමයි.
2.ගැටුම් දිග්ගැස්සීම වළක්වා ලීමයි.
3.ගැටුමේ ඒක පාර්ශවීය ජයග්‍රහණය වළක්වාලීමයි.
4.ගැටුමේ ව්‍යාප්තිය පාලනය කිරීමයි.
5.ගැටුමේ ගතිකත්වය,අරමුණු හා අභිලාෂ පරිවර්තනයට ලක් කිරීමයි.

17. දාර්ශනිකයන්ගේ නම සමඟ ඇති නිවැරදි අදහස අදාළ වගන්තිය තෝරන්න.
1.මැකියාවෙලි - අයිතිවාසිකම් මිනිසාට ස්වභාවධර්මයෙන් හිමි වේ.
2.රූසෝ - මිනිසා නිදහස්ව ඉපදුනද සැම තැනම යදමින් බැඳී ඇත.
3.ජෝන් ලොක් - බලය ලබා ගැනීමට කරන ඕනෑම දෙයක් සාධාරණය.
4.ප්ලේටෝ - ස්වාධිපති බලය දරන්නේ මහජනතාවයි.
5.ඇරිස්ටෝටල් - මිනිසා උපතින්ම දේශපාලන ජීවියෙක් නොවේ.

18.රාජ්‍ය ප්‍රතිපත්තිය,
1.දේශපාලන පක්ෂවල බලපෑමෙන් සපුරා නිදහස්ය.
2.මහජන දුක්ගැනවිලි නිරාකරණය පිළිබඳ සැලකිලිමත් නොවේ.
3.නිලබල තන්ත්‍රයට වැදගත් භූමිකාවක් නොපවරයි.
4.රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාව ප්‍රවර්ධනය නොකරයි.

19.බලතල බෙදීමේ සංකල්පය තුළින් මොන්ටෙස්ක්‍යු අපේක්ෂා කළේ,
1.බලය සංවරණය හා තුලනය කිරීමයි.
2.පරිපාලනය විමධ්‍යගත කිරීමය.
3.මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමය.
4.ශක්තිමත් සිවිල් සමාජයක් පැවතීමය.
5.අධිකරණ විමර්ශන බලය ක්‍රියාත්මක කිරීමය.

20.ජාත්‍යන්තර දේශපාලනයේ ක්‍රියාකාරීන් වන්නේ,
1.දේශපාලන පක්ෂ හා ප්‍රභූ කණ්ඩායම්ය.
2.ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා සමාජ සංවිධාන වේ.
3.බහු ජාතික සමාගම් හා රාජ්‍ය නොවන සංවිධාන වේ.
4.ජාත්‍යන්තර මූල්‍ය හා සංස්කෘතික සංවිධාන වේ.

අංක 21 සිට 25 දක්වා සපයා තිබෙන ප්‍රකාශ පහ අතුරින් මාතෘකාවට අදාළව නිවැරදි නොවන ප්‍රකාශය තෝරන්න.

21.බ්‍රිතාන්‍ය ආණ්ඩු ක්‍රමය,
1.බ්‍රිතාන්‍යයේ පවතින්නේ අගමැතිවරයාගේ ආණ්ඩුවකි.
2.අසහාය රාජ්‍යත්වය බ්‍රිතාන්‍ය තුළ තවමත් කැපී පෙනේ.

3.රැජිණ රජකම් කරයි.එහෙත් පාලනය නොකරයි.
4.ව්‍යවස්ථාදායකය ද්විමණ්ඩලිකවාදය අනුව ගොඩ නගා ඇත.
5.පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීති විවරණය කිරීමට එරට අධිකරණයට බලය නොමැත.

22.ඇමෙරිකානු ආණ්ඩුක්‍රමය,
1.සංවරණ හා තුලන ක්‍රමය අත්‍යවශ්‍ය අංග ලක්ෂණයක් වීම.
2.නීතිවල ව්‍යවස්ථානුකූලභාවය තීරණය කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණය සතුවීම.
3.අයවැය වාර්තාව අනුමත කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට සෙනෙට් සභාවට බලය ඇත.
4.ජනාධිපතිවරයා වෙත සියලු බලතල කේන්ද්‍රගත වී තිබේ.
5.ජනාධිපතිවරණයේදී පැහැදිලි බහුතරයක් කිසිඳු අපේක්ෂකයෙකුට ලබා ගැනීමට නොහැකි වේ නම් ජනාධිපතිවරයා තේරීමේ බලය මහජන මන්ත්‍රී මණ්ඩලයට ලබාදෙයි.

23.ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෆෙඩරල් මූලධර්ම,
1.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලිඛිත අනම්‍ය එකක් වීම.
2.මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර බලතල බෙදා තිබීම.
3.ද්විමණ්ඩලික ව්‍යවස්ථාදායකයක් පැවතීම.
4.මධ්‍යම ආණ්ඩුව තුළ සෑම ප්‍රාන්තයකටම සමාන නියෝජනයක් ලබා දීම.
5.ශ්‍රේෂ්ඨාධිකරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආරක්ෂකයෙකු ලෙස කටයුතු කිරීම.

24.දේශපාලන චින්තකයින්ගේ නම් සහ ඔවුන්ගේ රචනා,
1.ඇරිස්ටෝටල් - ජනරජය
2.නිකලොයි මැකියාවෙලි - කුමාරයා
3.තෝමස් හොබ්ස් - ලෙවියාකන්
4.වුඩ්රෝ විල්සන් - පරිපාලනය අධ්‍යයනය කිරීම.
5.කාල් මාක්ස් - ප්‍රාග්ධනය

25.ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමයේ ඇති ප්‍රජාතන්ත්‍රවාදී නොවන අංග වන්නේ,
1.දේශපාලන ප්‍රචණ්ඩත්වය හා සිවිල් යුද්ධය
2.මානව අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම.
3.ආණ්ඩුකරණ ක්‍රියාවලිය තුළ සිදුවන දූෂණය හා බලය අවභාවිත කිරීම.
4.බලය විමධ්‍යගත කිරීම.
5.හදිසි නීතිය හා ඒ යටතේ මූලික අයිතිවාසිකම් අත් හිටුවීම.

අංක 26 සිට 30 තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත.එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලය වඩාත් ගැලපෙන්නේ පහත වගුවේ දැක්වෙන 1,2,3,4 සහ 5 යන වරණවලින් කවර වරණය දැයි තෝරන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | සත්‍ය | සත්‍ය |
| 2 | සත්‍ය | අසත්‍ය |
| 3 | අසත්‍ය | සත්‍ය |
| 4 | අසත්‍ය | අසත්‍ය |
| 5 | සත්‍ය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය තව දුරටත් පැහැදිලි කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 26. | 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ මහජන පරමාධිපත්‍ය පදනම් කරගත් ආණ්ඩුකරණයයි. | මෙම ආණ්ඩුක්‍රමයේදී ව්‍යවස්ථාදායක කාර්ය සඳහා මන්ත්‍රීවරුන් 61 දෙනෙකුගෙන් යුත් රාජ්‍ය මන්ත්‍රණ සභාවක් පිහිටුවන ලදී. |

1.)1 2.)2 3.)3 4.)4 5.)5

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 27. | 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කැබිනට් මාදිලියේ ආණ්ඩුක්‍රමයක් හඳුන්වා දුන්නේය. | ආණ්ඩුව සම්බන්ධව බ්‍රිතාන්‍ය කිරීටයේ නායකත්වය පවත්වා ගත්තේය. |

1.)1 2.)2 3.)3 4.)4 5.)5

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 28. | 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව සම්පූර්ණයෙන්ම ශ්‍රී ලාංකික නිර්මාණයකි. | එහි දක්වා තිබූ මූලික අයිතිවාසිකම් සහ නිදහස පිළිබඳ පරිච්ඡේදය උල්ලංඝණය වූ විට අධිකරණ ක්‍රියාමාර්ග ගත හැකි |

| | | |
|---|---|---|
| | | විය. |

1.)1 2.)2 3.)3 4.)4 5.)5

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 29. | 1978 දී ස්ථාපිත කළ දෙවන ජනරජ ව්‍යවස්ථාව ඇමෙරිකාවේ ජනාධිපති ක්‍රමයට සමාන ජනාධිපති ක්‍රමයක් හඳුන්වා දුන්නේය. | ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව මගින් සම්මත කරන විශ්වාසභංග යෝජනාවක් මගින් තනතුරෙන් ඉවත් කළ හැකි වේ. |

1.)1 2.)2 3.)3 4.)4 5.)5

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 30. | 2015 දී සිදු කළ 19වන සංශෝධනය යටතේ ජනාධිපති තනතුර දැරීම සම්බන්ධ වාර දෙකේ කොන්දේසිය නැවත පනවන ලදී. | නිල කාලයද වසර හයේ සිට පහ දක්වා අඩු කරන ලදී. |

1.)1 2.)2 3.)3 4.)4 5.)5

31..19 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යයන්ට එකතු කරන ලද කාර්යයන් දෙකක් දක්වන්න.

I. ...............................................
II. ...............................................

32..ලංකාවේ පක්ෂ ක්‍රමයේ ඇති ප්‍රධාන ලක්ෂණය නම් එය කුඩා පක්ෂ ගණනාවක් ද පවතින අධිපති ද්වි පක්ෂ ක්‍රමයක් වීමයි.එහි අධිපතිත්වය දරණ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක නම් කරන්න.

I. ...............................................
II. ...............................................

33.ජාත්‍යන්තර දේශපාලනයේ ක්‍රියාධාරයෝ වර්ග දෙකකි.නම් කරන්න.

I. ...............................................
II. ...............................................

34.ඇමෙරිකානු සහ බටහිර රාජ්‍ය වලට එරෙහිව යුද්ධ ප්‍රකාශ කරන තත්ත්වයක් ඇති කරමින් ත්‍රස්තවාදී සංවිධාන පුලුල් වී තිබේ.එවැනි ලෝක ත්‍රස්තවාදී කණ්ඩායම් දෙකක් නම් කරන්න.

I. ............................................
II. ............................................

35.නූතන රාජ්‍ය විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කරනු ලබන ක්‍රමවේද කිහිපයකි.එයින් දෙකක් නම් කරන්න.

I. ...........................................
II. ..........................................

36. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ රජයේ විධායක තනතුරු වලට ජනාධිපතිවරයාට නිර්දේශය සැපයීම පිණිස පිහිටවා තිබූ සභාව කුමක්ද?..................................................................................

එම සභාවේ සාමාජික සංඛ්‍යාව කොපමණද ? ..........................................

37.පළාත් සභා ක්‍රමය තුළ බලතල බෙදා ඇත්තේ ලැයිස්තු තුනක් යටතේය.ඉන් දෙකක් දක්වන්න.

I. ..................................................
II. ..................................................

38.ශ්‍රී ලංකාව පොදු රාජ්‍ය මණ්ඩලයේ සාමාජිකත්වය ලබා ගත්තේ කුමන වර්ෂයේද? ..........................

23 වන පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක සමුලුව 2013 දි පැවැත්වුයේ කුමන රටේද?................................